# පොල්වත්තේ ශ්‍රී බුද්ධදත්ත නාහිමි

කාලය පැය දෙකයි.

අමතර කියවීම් කාලය - මිනිත්තු 10යි.

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.
- (1), (2), (3), (4) උත්තර වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන උත්තරය තෝරන්න.

01. පොල්වත්තේ බුද්ධදත්ත හිමියන් ජන්ම ලාභය ලැබූයේ,

1. 1881 වර්ෂයේ ය.
2. 1887 වර්ෂයේ ය.
3. 1889 වර්ෂයේ ය.
4. 1787 වර්ෂයේ ය.

02. පොල්වත්තේ බුද්ධදත්ත හිමියන් අපවත් වී වදාළේ,

1. 1962 වර්ෂයේ ය.
2. 1965 වර්ෂයේ ය.
3. 1975 වර්ෂයේ ය.
4. 1960 වර්ෂයේ ය.

03. බුද්ධදත්ත හිමියන් ජන්ම ලාභය ලැබූ පොල්වත්ත ග්‍රාමය පිහිටා ඇත්තේ,

1. දකුණු පළාතේ ය.
2. මධ්‍යම පළාතේ ය.
3. ඌව පළාතේ ය.
4. උතුරමැද පළාතේ ය.

04. පොල්වත්තේ බුද්ධදත්ත හිමියන්ගේ ජීවන තොරතුරු අතර සාවද්‍ය කරුණක් වන්නේ,

1. ඕබඩගේ ලුවිස් ද සිල්වා පියතුමා විය.
2. තුය්යාගම්හේවා සාඤ්චිහාමි මැණිය විය.
3. සහෝදර සහෝදරියන් 05දෙනෙකි.
4. බුද්ධදත්ත හිමියන් පවුලේ වැඩිමලා විය.

05. පොල්වත්තේ බුද්ධදත්ත හිමියන් මුලින්ම අධ්‍යාපනය ලබා ඇත්තේ,

1. අම්බලන්ගොඩ බෞද්ධ ඉංග්‍රීසි පාඨශාලාවෙනි.
2. දොඩම්ගස්දූවේ පාසලෙනි.
3. පොල්වත්ත ග්‍රාමයේ පිහිටි පාසලෙනි.
4. නිවෙස අසල පිහිටියා වූ විහාරස්ථානයෙනි.

06. පොල්වත්තේ බුද්ධදත්ත හිමියන් පැවිදි වූයේ,

1. 1890 වර්ෂයේ ය.
2. 1899 වර්ෂයේ ය.
3. 1880 වර්ෂයේ ය.
4. 1891 වර්ෂයේ ය.

07. බුද්ධදත්ත හිමියන් පැවිදි වන විට උන්වහන්සේ,

1. පසළොස්වන වියේ පසුවූහ.
2. තෙළොස්වන වියේ පසුවූහ.
3. දොළොස්වන වියේ පසුවූහ.
4. සොළොස්වන වියේ පසුවූහ.

08. බුද්ධදත්ත හිමියන්ගේ පැවිදි ගුරුවරුන් වන්නේ,

1. ධර්මාධාර හිමි, පියරතනතිස්ස හිමි
2. රේවත හිමි, ධම්මපාල හිමි
3. කාශ්‍යප හිමි, සාරිපුත්ත හිමි
4. බුද්ධඝෝෂ හිමි, සිරිධම්ම හිමි

09. පොල්වත්තේ බුද්ධදත්ත හිමියන් පළමුවෙන්ම බුරුමදේශයට වැඩම කළේ,

1. 1990 වර්ෂයේ දී ය.
2. 1902 වර්ෂයේ දී ය.
3. 1899 වර්ෂයේ දී ය.
4. 1905 වර්ෂයේ දී ය.

10. පොල්වත්තේ බුද්ධදත්ත හිමියන් රචනා කළ කෘති අන්තර්ගත නොවන වර්ණය වන්නේ,

1. පාලිභාසප්පවෙසිනී, අභිධර්මමාතෘකා ස්වරූපය
2. බුද්ධගුණදීපනිය, කර්මවීර්යදීපනී, විශුද්ධිදීපනී
3. බුද්ධ ධර්ම සංග්‍රහ, බෞද්ධ සූත්‍ර
4. නාමරූපපරිච්ඡෙද, හෙ සිරිමාවාදය, සත්ත්වතත්වදර්ශනය

11. ක්‍රිස්තු භක්තිකයන් බෞද්ධාගමට විරුද්ධව ලියූ 'දෘෂ්ටිවිභාගය' කෘතියට පිළිතුරු වශයෙන් පොල්වත්තේ බුද්ධදත්ත හිමියන් ලියූ කෘතිය වන්නේ,

1. දසසංඥාවිභාගය
2. සත්‍ය දර්ශනය
3. හෙ සිරිමාවාදය
4. ගාරවාගාරවවිනිච්ඡය

12. පාලි භාෂාවතරණය පොත් 3 රචනා වූ කාලය නිවැරදිව දක්වා ඇති වර්ණය වන්නේ.

1. 1923, 1925, 1927 වර්ෂවල ය.
2. 1922, 1924, 1926 වර්ෂවල ය.
3. 1925, 1927, 1929 වර්ෂවල ය.
4. 1921, 1923, 1925 වර්ෂවල ය.

13. ලක්දිවෙන් බුරුමයට උපසම්පදාව රැගෙන යාම පිළිබඳ තොරතුරු අන්තර්ගත කෘතිය වන්නේ,

1. පාළි පාඨාවලී
2. කල්‍යාණිශිලාලිපි
3. පාලිවාක්‍ය විවේචනය
4. විශුද්ධිදීපනි

14. පොල්වත්තේ බුද්ධදත්ත හිමියන්ගේ ජීවන චරිතය පිළිබඳ දැක්වෙන කරුණු අතර සාවද්‍ය තොරතුරක් දැක්වෙන වර්ණය වන්නේ,

1. උන්වහන්සේ ලංකා විශ්වවිද්‍යාලයේ ආචාර්යවරයෙකු ලෙස කටයුතු කර ඇත.
2. බුරුමයේ පැවැත්වූ ඡට්ඨ සංගායනාව සඳහා ලංකාව නියෝජනය කර ඇත.
3. අග්ගමහාපණ්ඩිත උපාධියෙන් පිදුම් ලබා ඇත.
4. පාලි ග්‍රන්ථ සමිතිය ආරම්භ කර ඇත.

15. බුද්ධදත්ත හිමියන් අපවත් වන විට දැරූ නායක පදවිය වන්නේ,

1. ශ්‍යාමෝපාලි මහනිකායේ මහානායක ධුරය
2. අමරපුර කල්‍යාණවංස මහනිකායේ මහානායක ධුරය
3. ඌව අමරපුර නිකායේ මහානායක ධුරය
4. රාමඤ්ඤ නිකායේ අනුනායක ධුරය

16. බුද්ධදත්ත හිමියන් බුරුමයේ දී රචනා කළ කෘතියක් වන්නේ,

1. පාලිභාසප්පවෙසනී
2. හෙ සිරිමාවාදය
3. පාලිභාෂාවතරණය
4. හියුං සියෑං භ්‍රමණවෘතාන්තය

17. බුද්ධදත්ත හිමියන් උපසම්පදාව ලබා ගැනීමේ දී උපාධ්‍යායන් වහන්සේ වූයේ,

1. දිඹුලාගල කාශ්‍යප හිමි
2. විසුද්ධාචාර හිමි
3. සාගරඤාණ හිමි
4. ශ්‍රී ධර්මාධාර හිමි

18. බුද්ධදත්ත හිමියන් ලියූ මුල්ම කෘතිය සහ එවිට උන්වහන්සේගේ වයස වන්නේ

1. පාලිභාසප්පවෙසනී, අවුː 18
2. අභිධර්ම මාතෘකා ස්වරූපය, අවුː 18
3. පාළිපාඨාවලී, අවුː18
4. සත්‍ය දර්ශනය, අවුː19

19. 'ගාරවාගාරවවිනිච්ඡය' කෘතිය රචනා කිරීමට හේතුව වන්නේ,

1. ක්‍රිස්තුභක්තිකයන් බුද්ධාගමට විරුද්ධව ලියූ දෘෂ්ටි විභාගය පොතට පිළිතුරු ලෙස
2. බණ අසන විට ඉඳින ආකාරය පිළිබඳව ඇති වූ වාදයට පිළිතුරු ලෙස
3. අම්බලන්ගොඩ වෛශාඛනිධාන සමිතියේ ඉල්ලීම ලෙස
4. බුරුම භික්ෂූන්ගේ ප්‍රයෝජනය පිණිස

20. රාත්‍රීවාරය නමින් හඳුන්වන්නේ,

1. ගුරු සිසු දෙපක්ෂයම කළුවරේ ඉඳගෙන පොතක් නොමැතිව අභිධර්මය උගන්වන ක්‍රමය
2. ගුරු සිසු දෙපක්ෂයම කළුවරේ ඉඳගෙන පොතක් නොමැතිව පාලි භාෂාව උගන්වන ක්‍රමය
3. සිසුන් කළුවරේ ඉඳගෙන පොතක් නොමැතිව අභිධර්මය ඉගන්ගන්නා ක්‍රමය
4. සිසුන් කළුවරේ ඉඳගෙන පොතක් නොමැතිව පාලි භාෂාව ඉගන්ගන්නා ක්‍රමය

21. 'සත්‍ය දර්ශනය' කෘතිය රචනා කිරීමට හේතුව වන්නේ,

1. ක්‍රිස්තුභක්තිකයන් බුද්ධාගමට විරුද්ධව ලියූ දෘෂ්ටි විභාගය පොතට පිළිතුරු ලෙස
2. බණ අසන විට ඉඳින ආකාරය පිළිබඳව ඇති වූ වාදයට පිළිතුරු ලෙස
3. අම්බලන්ගොඩ වෛශාඛනිධාන සමිතියේ ඉල්ලීම ලෙස
4. බුරුම භික්ෂූන්ගේ ප්‍රයෝජනය පිණිස

22. 'පාළිපාඨාවලී' කෘතිය රචනා කළ වර්ෂය වන්නේ,

1. 1923 2. 1952 3. 1904 4. 1926

23. 2500 බුද්ධජයන්තිය නිමිත්තෙන් පැවැත්වූ සංගායනාව වන්නේ,

1. පංචසතිකා සංගායනාව
2. සප්තසතිකා සංගායනාව
3. සාහස්සිකා සංගායනාව
4. ඡට්ඨ සංගායනාව

24. ලක්මිණි පහන කර්තෘතුමා උසස් උදවිය සඳහා හෙ යන වීචාර්ථ ආමන්ත්‍රණය යෙදීම අයෝග්‍යයැයි කළ වාදයට පිළිතුරු ලෙස රචනා කළ කෘතිය වන්නේ,

1. දෘෂ්ටි විභාගය
2. දශසංඥාවිභාගය
3. හෙ සිරිමාවාදය
4. නාමරූපපරිච්ඡේද

25. බුරුම රජයෙන් ශ්‍රී ලාංකික භික්ෂුවකට පිරිනමන ඉහළම ගෞරව සම්මානය වන්නේ,

1. රාජගුරු
2. අග්ගමහා පණ්ඩිත
3. සංඝපරිණායක
4. මහාථෙර

*පවත් රොදක්ව හමන්නට පෙරුම් පුරනා දරුවනේ....*

*නොවී සැඩ මාරුතය හමන්න සිහිලැල් පවනක්ව*

*කාරුණික සිතින් පිරී...*